තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව ඉදිරිපිටදීය.

## එච්.එම්. ජයසේකර එ. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව

RTIC Appeal (පුද්ගලික වශයෙන් විභාග කිරීම)/ 829/2019 (2019.06.19) දින පැවති විධිමත් කොමිෂන් සභා රැස්වීමේදී විභාග කිරීමෙන් අනතුරුව අනුමත කරන ලද නියෝගය.

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන්හි (ගාස්තු හා අභියාචන කාර්යය පටිපාටිය), රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්යය පටිපාටිය.

.

**සභාපති:** මහින්ද ගම්මම්පිල
**කොමිෂන් සභා සමාජික:** ජ්‍යෙෂ්ඨ නීතිඥ එස්. ජී. පුංචිහේවා
**කොමිෂන් සභා සමාජික:** විනිසුරු රෝහිණී වල්ගම

**අධ්‍යක්ෂ:ජනරාල්-** ඩී.ජී.එම්.වී. හපුආරච්චි

**අභියාචක** - එච්.එම්. ජයසේකර
**නොතිසි ලත් පාර්ශවය**- නම් කළ නිලධාරී, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව

**පෙනීසිටීම**

අභියාචක - පැමිණ නැත.
පොදු අධිකාරිය - යූ.ටී. වාසනා සොමි කැලුම් - සහකාර අධ්‍යක්ෂ (නීති)

| | |
|---|---|
| තොරතුරු ඉල්ලීම ගොනු කරන ලද දිනය | 2018.09.15 |
| තොරතුරු නිලධාරියා තීරණය ලබා දුන් දිනය | ප්‍රතිචාරයක් නොමැත. |
| නම් කල නිලධාරියා වෙත අභියාචනය යොමු කළ දිනය | 2018.09.29 |
| නම් කල නිලධාරියා තීරණය ලබා දුන් දිනය | ප්‍රතිචාරයක් නොමැත. |
| තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව වෙත අභියාචනය යොමු කළ දිනය | 2018.10.20 |

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව ඉදිරිපිටදීය.

## අභියාචනයට පසුබිම් වූ කරුණු:

අභියාචක විසින් 2018.09.15 දිනැති තොරතුරු ඉල්ලීම මඟින් පහත තොරතුරු ඉල්ලා සිටින ලදි.

1. 2007-2016 කාලය ඇතුළත මා වෙත නිකුත් කර ඇති පත්වීම් ලිපිවල පිටපත්
2. එම පත්වීම් ලිපිවලට අදාළ වැටුප් පරිමාණයක් මාවෙත නියමිත දිනට ගෙවා ඇත්ද?
3. එසේ ගෙවා නොමැති නම් එම වැටුප් වර්ධක
    - ප්‍රමාද කිරීම්
    - අත්හිටුවීම්
    - විලම්භනය කිරීම් සිදු කර ඇත්ද?

එසේ සිදු කර ඇත්නම් ඒ බව හේතු සහිතව මා වෙත දන්වා ඇතිද යන්න

4. 07-2016 කාලය තුළ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම විසින් මාහට විරුද්ධව කිසියම් විනය පරීක්ෂණයක් සිදු කර ඇත්ද? එය සිදු කර ඇත්නම් මා එම පරීක්ෂණ වලදී වැරදිකරු වී ඇත්ද යන්න
5. 2016 වසරේදී මගේ වැටුප් වර්ධක ගෙවීම සම්බන්ධ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ එවකට අධ්‍යක්ෂ ජෙනරාල් දැරූ විජිත නන්ද කුමාර් මහතා ඒ පිළිබඳව කරන ලද නිර්දේශවල සටහන්
6. 2017 වසරේදී මගේ වැටුප් වර්ධක නොගෙවීම සම්බන්ධව කම්කරු දෙපාර්තමේන්තුවේ විශේෂ විමර්ශන ඒකකය විසින් කරන ලද පරීක්ෂණයෙන් පසු

    මෙම පරීක්ෂණයට ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම වෙනුවෙන් සහභාගී වූ සහකාර අධ්‍යක්ෂතුමා විසින් ඉදිරිපත් කරන ලද ප්‍රකාශ හා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම වෙත ඉදිරිපත් කළ වාර්තාව

    කම්කරු දෙපාර්තමේන්තුවේ විශේෂ පරීක්ෂණ ඒකකය විසින් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම වෙත ඉදිරිපත් කරන ලද නිර්දේශ වාර්තාව

තොරතුරු නිලධාරියා පනත ප්‍රකාරව, නියමිත කාලය තුළ පිළිතුරු සැපයීමට අපොහොසත් වූ බැවින් අභියාචක විසින් 2018.09.29 දිනැතිව නම්කළ නිලධරයා වෙත අභියාචනයක් යොමු කරන ලදී. නම්කළ නිලධරයාද පනත ප්‍රකාරව, නියමිත කාලය තුළ ප්‍රතිචාර දැක්වීමට අපොහොසත් වූ බැවින් අභියාචක විසින් 2018.10.20 දිනැතිව කොමිෂන් සභාව වෙත අභියාචනයක් යොමු කරන ලදී.

## අභියාචනය සලකා බලන අවස්ථාවේදී උද්ගතවූ කාරණා:

අභියාචක පැමිණ නැත. ඉල්ලා ඇති තොරතුරු යවා ඇති බව පොදු අධිකාරිය දැනුම් දෙයි. තොරතුරු ලබා දී ඇති බව සලකා ගොනුවේ කටයුතු අවසන් කරනු ලැබේ.

**නියෝගය:**
2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 3(1) වගන්තිය ප්‍රකාරව අභියාචක විසින් ඉල්ලුම් කොට ඇති තොරතුරු පොදු අධිකාරිය සතුව පවතින හෙයින්ද, 5(1) වගන්තියේ ව්‍යතිරේකයට යටත් නොවන හෙයින්ද, එම ඉල්ලීමට අදාළ තොරතුරු ලබා දී ඇති බැවින් අභියාචනය අවසන් කරනු ලැබේ.

කොමිෂන් සභා රීතින්හි, රීති අංක 27 (ගාස්තු හා අභියාචනා කාර්යය පටිපාටිය, ගැසට් අංක 2004/66, 2017.02.03) ප්‍රකාරව මෙම නියෝගය දෙපාර්ශවය වෙත සන්නිවේදනය කරනු ලැබේ.